

# පොරමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලයට අමාත්‍ය එස්.බී.ගෙන් 19 ලක්ෂයක්

රන්ටැඹේ ජාතික ශිෂ්‍ය භට බලකා පුහුණු මධ්‍යස්ථානයේ දී පසුගිය ඔක්තෝබර් 11 සිට 20 දක්වා පැවැති සමස්ත ලංකා හර්මන්ලෝස් කුසලාන ශිෂ්‍ය භට තරගාවලිය නියෝජනය කිරීම සඳහා නු / පොරමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍ය භට කණ්ඩායම් 04 ක් සහභාගි කරවීමට වියදම්වූ රුපියල් 19 ලක්ෂයකට අධික මුදලක් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ ආරක්ෂණ අරමුදලෙන් පොරමඩුල්ල මධ්‍ය මහ විද්‍යාලයට ලබා දීමට සමාජ සංවර්ධන හා සුභසාධන අමාත්‍ය එස්.බී.දිසානායක මහතා අද (08) පියවර ගත්තේය.

මෙවර පොරමඩුල්ල මධ්‍ය මහ විද්‍යාලය විසින් හර්මන්ලෝස් කුසලානය සඳහා ශිෂ්‍යභට කණ්ඩායම් 04 ක් ඉදිරිපත් කර තිබේ. ඒ විද්‍යාලයේ පවතින ශිෂ්‍ය භට කණ්ඩායමට අමතරව තවත් කණ්ඩායම් 03 ක් වශයෙනි. ශිෂ්‍ය භටයන් 75 දෙනෙකු ගෙන් සමන්විත නව කණ්ඩ 03 සඳහා වියදම්වූ රුපියල් 1947060/- ක මුදල විද්‍යාලයට ලබා දෙන බවට අමාත්‍ය එස්.බී.දිසානායක මහතා පොරමඩුල්ල ම.ම.විද්‍යාලයට වූ පොරොන්දුවක් මත මෙම මුදල දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ ආරක්ෂණ අරමුදලෙන් ලබා දීමට ක්‍රියාකර ඇත.

අද (08) බත්තරමුල්ල අමාත්‍ය කාර්යාලයේදී පැවැති චෙක්පත පිරිනැමීමේ අවස්ථාවට විද්‍යාලය වෙනුවෙන් විදුහල්පතිනි ආර්.එම්.ජී.ආර්. වික්‍රමසිංහ, යුධ හමුදා ශිෂ්‍යභට කණ්ඩ භාර නිලධාරි එන්.පී.පී.යටිවැල්ල, තූර්ය වාදක කණ්ඩයේ කණ්ඩභාර නිලධාරි 2ලුතිනන් එච්.එම්.ටී.එම්.හිටිහාමු, පාසල් සංවර්ධන සමිතියේ ලේකම් ඕ.ජී.ආර්.බණ්ඩාර යන මහත්ම මහත්මීන් ඇතුළු ශිෂ්‍ය භට කණ්ඩයේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය භටයන් හා බලිකාවන් අටදෙනෙකු සහභාගිවූ අතර සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශ ලේකම් මහින්ද සෙනෙවිරත්න, දිවිනැගුම අධ්‍යක්ෂ ජනරාල් නීල් හපුහින්න, අමාත්‍ය උපදේශක ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න හා සමාජ සුබසාධන හා සමාජ ආරක්ෂණ අධ්‍යක්ෂ යූ.අනුර එස්.වීරරත්න යන මහත්වරු සහභාගිවූහ.

ඡායාරූප යෙන් දැක්වෙන්නේ අමාත්‍යවරයා විසින් විදුහල්පතිනිය වෙත අදාල චෙක්පත භාර දුන් අයුරුය.